SC

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
26 APR 2010
UNIVERSITY OF KELANIYA

# ඇඟලුම් කර්මාන්තයේ නියුතුවූවන්ගේ ක්ලමථය ආශ්‍රිත ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

ඩී. ටී. ඩී. අලහකෝන්

FGS/P/MSSc /2005/01

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2008 මැයි



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 600 |
| වර්ග අංකය | |

# නිබන්ධ සාරාංශය

1970 දශකයේදී සුළු පරිමාණයෙන් ආරම්භ වූ ඇඟලුම් කර්මාන්තය 1986 වන විට ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අපනයන වන තේ රබර් සහ පොල් යන වෙළඳ බෝග අභිබවා ගොස් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අපනයන කර්මාන්තය බවට පත් විය. පුද්ගලයින් තුන් ලක්‍ෂයකට පමණ සෘජු රැකියා සපයන නිෂ්පාදන ඒකක අට සීයක් පමණ අද ඇඟලුම් අංශය සතුව ඇත. පසුගිය වසර විස්ස තුළ දී මෙම කර්මාන්තය බෙහෙවින් කැපී පෙනෙන ව්‍යාප්තියක් පෙන්නුම් කර තිබේ. මෙම කැපී පෙනෙන වර්ධනයට මූලික වශයෙන් ම හේතු වන්නේ සාපේක්ෂ වශයෙන් ශ්‍රමය අවම වැටුපකට ලබා ගත හැකි වීමයි. කාන්තා ශ්‍රම බලකාය ඇඟලුම් කර්මාන්තයේ රැකියාවල යෙදීම සීඝ්‍ර ලෙස ඉහළ යාම මේ තත්ත්වය වඩාත් පහසු කර ඇත.

රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළට කාන්තාව අනුගත වීමෙන් තමාගේ ම ශ්‍රමයෙහි ප්‍රතිලාභියෙකු මෙන් ම රටේ ආර්ථික ඵලදායීතාවයේ ද ප්‍රධාන කොටස් කාරයෙකු බවට පත්ව ඇත. එමෙන් ම රටේ ආර්ථික සංවර්ධනයට ලබා දෙන සක්‍රිය සහභාගීත්වයත් සමඟ තම පෞද්ගලික ජීවිතය තුලනය කර ගැනීමේදී විශාල මානසික පීඩාකාරී තත්ත්වයකට ඔවුන් මුහුණ දෙති. මනෝවිද්‍යාවේදී ක්ලමථය වශයෙන් හඳුන්වනු ලබන්නේ මෙම මානසික පීඩාකාරී තත්ත්වයයි.

ඉතාමත් කෙටි කාලයක් තුළ දී කායික, මානසික, චර්යාමය හා ප්‍රජානනමය වෙනස්කම් රාශියක් ඇති කරන ක්ලමථය සඳහා පුද්ගලයෙකුගේ පෞද්ගලික ජීවිතය, රැකියාව වැනි විවිධ සාධක බලපෑ හැකි අතර පුද්ගලයා ක්ලමථයට එදිරිව මුහුණ දෙනු ලබන ආකාරය, පුද්ගල අත්දැකීම්, පෞරුෂය සහ ජීවිත දර්ශනය අනුව එක් එක් පුද්ගලයාගේ ක්ලමථ මට්ටමෙහි වෙනස් වීම් දැක ගත හැකි වේ.

ක්ලමථය සෑම විටම නිශේධනාත්මක නොවුණත් ක්ලමථ කළමනාකරණය සම්බන්ධයෙන් බොහෝ විට පුද්ගලයා දක්වන දුර්වල කුශලතාවය හේතුවෙන් ක්ලමථය වර්ධනය වීමට නොදී පාලනය කර ගත යුතු තත්ත්වයක් බවට පත්ව ඇත.

මෙම අධ්‍යයනය මඟින් මනෝවිද්‍යාවේ එක් සුවිශේෂ ගැටලුවක් වන ක්ලමථය පිළිබඳ අධ්‍යයනය කිරීම පමණක් සිදු කෙරේ. ඒ යටතේ ඇඟලුම් කර්මාන්තයේ සේවයේ නියුතු කාන්තාවන්ගේ ක්ලමථයේ ස්වභාවය, ඔවුනගේ ක්ලමථ මට්ටම, ක්ලමථය කෙරෙහි බලපෑ හැකි සාධක, එය ඔවුනගේ දෛනික ජීවිතයට බලපාන අන්දම සහ ක්ලමථයෙන් අත්මිදීම සඳහා කුමක් කළ යුතු ද වැනි කරුණු මෙමඟින් අධ්‍යයනය කෙරේ. ඊට අදාළ ප්‍රාථමික දත්ත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඇසුරින් ද ද්විතියික දත්ත ග්‍රන්ථ, සඟරා, පුවත්පත් පරිශීලනය මඟින් ද ලබා ගන්නා ලදී.

ඇඟලුම් සේවිකාවන් තම ගැටලු තමා තුළ ම සඟවාගෙන මානසිකව පීඩා විඳින අයුරක් හඳුනාගත හැකිවන අතර මනෝවිද්‍යා උපදේශනය වෙත යොමු වන පිරිස ද ඉතාමත් සීමිතය. එමෙන් ම ඔවුනගේ මානසික ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලෙස ප්‍රායෝගිකව ක්‍රියාත්මක වී ඇත්තේ ඉතාමත් ප්‍රාථමික මට්ටමේ සැලසුම් පමණක් වීම ද මෙම අධ්‍යයනයේ දී අනාවරණය වූ සුවිශේෂ කරුණකි.

මේ අනුව ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන දොරටුව විවෘත කරනු ලබන ඇඟලුම් සේවිකාව ක්ලමථයෙන් ආරක්‍ෂා කිරීම ජාතික කර්තව්‍යයකි.